පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව සබරගමුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංගකලාව

පළමු වාරය - ජනවාරි - 3 වන සතිය

09 ශ්‍රේණිය

සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී.
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

**<u>තොරතුරු පත්‍රිකාව</u>**

# නාට්‍යයක ගැටුම

*'ගැටුමක් නැති තැන නාට්‍යයක් නොමැත.'* යනුවෙන් බර්නාඩ් ෂෝ නැමැති විචාරකයා පවසා ඇත. මෙම ප්‍රකාශය මඟින් පෙනි යන්නේ නාට්‍යයක ගැටුම නාට්‍යයකට ඉතා වැදගත් සේම අනිවාර්ය අංගයක් වන බවයි. නාට්‍යයක ගැටුම ඇති වන්නේ එහි කතා පුවත තුළින්ම ය. ගැටුමේ දී විවිධ ස්වරූප දැකිය හැකිය.

1. මිනිසා හා පරිසරය අතර ඇති වන ගැටුම
2. මිනිසා හා සමාජය අතර ඇති වන ගැටුම
3. මිනිසා හා තමා අතර හෝ චිත්තවේග (සිතුවිලි) අතර ගැටුම
4. මිනිසා හා මිනිසාට වැළැක්විය නොහැකි බලවේග අතර ඇති වන ගැටුම
5. එක් සමාජ බලවේගයක් හා තවත් සමාජ බලවේගයක් අතර ඇති වන ගැටුම

පෙළ රචකයා, නාට්‍ය පෙළ ගොඩනගනංවනු ලබන්නේ ගැටුම් අවස්ථා සමඟිනි. බොහෝවිට *"ගැටුම"* ඇති වන්නේ චරිත අතර ප්‍රතිවිරෝධ අදහස් මතුවීමෙනි. ගැටුම නිසා පවතින තත්ත්වය කොයි දිශාවට ගමන් කරයි ද, විසඳුමක් ලැබේවි ද? ගැටුම කුමන ආකාරයට විසෙද්වි ද? යන කුතුහලය නිරන්තරයෙන් ප්‍රෙක්ෂකයා ඇද බැද තබා ගන්නා නූල වනුයේ නාට්‍යය ගැටුමයි.

සෑම නාට්‍යයක් ම ගැටුමකින් උපත ලැබිය යුතු බව ඇරිස්ටෝටල් පඬිවරයා පවසා ඇත. නාට්‍යයේ ආරම්භයේ සිට සිදුවන චරිතවල ක්‍රියාකාරිත්වය අතරින් ක්‍රමයෙන් ගැටුම මතු වී එය ගලා යන ආකාරය දැකිය හැක. අපට නියමිත නිර්දිෂ්ට නාට්‍යය පෙළ වන කදා වළලු නාට්‍යයෙහි මතුවන ගැටුම් අවස්ථා මොනවාදැයි විමසා බැලීමේ දී,

- සිටු දියණිය වළලු මිල දී ගැනීමට කැමැත්තෙන් සිටි මුත් මුදල් නොමැතිකමින් අකමැත්තෙන් වුව ද ඇය පසුබැම.
- සේරිවානිජ වෙළෙන්දා සිටු දියණියන් වළලු ගැනීමට පෙලඹවීම.
- දූෂ්‍ය ගති ඇති සේරිවානිජ වෙළෙන්දාගේ චරිතය දුෂ්ටත්වය මතු කෙරෙන සේ ගොඩ නැගී ඇත. එම නිසා සිටු දියණිය අපේක්ෂා කඩවීමත් සමඟ දැඩි කම්පනයට පත් වීම.

- සිටු දියණිය වළලු ගැනීමට දුම් බැඳුණු තලිය ගෙන ඒම.
- එම ප්‍රයත්නය ද අසාර්ථක වූ විට සිටු දියණිය අපේක්ෂා භංගත්වයට පත් වේ. සේරි වෙළෙන්දා කෝපයෙන් බැහැර වේ.
- කච්ඡපුට වෙළෙන්දා පැමිණි විට මිණිපිරියගේ ආශාව ඉටු කිරීමට මිත්තණිය ඉදිරිපත් වේ.
- දුම් බැඳුනු තලිය රන්තලියක් බව හඳුනාගැනීමත් සමඟ තලියෙහි වටිනාකමට සරිලන මුදල් හෝ භාණ්ඩ ඔහු ළඟ නොමැති බැවින් වෙළෙන්දා ගැටලුවකට මුහුණ දීම.
- තලියෙහි වටිනාකමට ඔහුට දිය හැකි වන්නේ කහවනු දහසක් සහ වළලු කද පමණකි. ඔහු මිත්තණියගෙන් තොටියාට දිය යුතු කහවණු අට පමණක් ඉල්ලා සිටියි.
- සේරි වෙළෙන්දා නැවත පැමිණෙන්නේ සිටු දියණියන් රවටා වළලු දෙකක් පමණක් දී තලිය ලබා ගැනීමට ය.
- මිත්තණියෝ සිදු වූ සියල්ල පවසා ඔහුට බැණ වදියි. ඔහුගේ චිත්තය වික්ෂිප්ත වී කද හා මුදල ද එතැන ද විසිකර දමා කච්ඡපුට පසුපස හඹා යයි. මෙම අවස්ථාවේදී චිත්ත අභ්‍යන්තරයේ සේම බාහිර වශයෙන් ද ගැටුම් අවස්ථා දැකිය හැකිය.
- ඔරුවේ නැගී යන කච්ඡපුට දකින සේරිවාණිජ වෙළෙන්දා තොටියා ආපසු කැඳවයි. කච්ඡපුට එය වළක්වයි. එහි ඵලය වනුයේ සේරිවාණිජගේ ළය පැලී මිය යාමයි.

## පැවරුම

1. නාට්‍ය ගැටුම යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
2. ගැටුමෙහි ප්‍රභේද ලියා දක්වන්න.
3. ගැටුම සම්බන්ධයෙන් ඇති නිර්වචනයක් ලියන්න.
4. කදා වළලු නාට්‍ය යේ ගැටුම් අවස්ථා කීපයක් ලියා දක්වන්න.